# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) විසින්, පහත දක්වා ඇති තනතුරු සඳහා යථා පරිදි සුදුසුකම්ලත්, යෝග්‍යතාපූර්ණ අයවලුන් වෙතින් 2021-03-26 වන දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

## (අ) සහකාර පුස්තකාලයාධිපති

**සුදුසුකම් :**

1. (i) විශේෂ උපාධියක, පළමුවන හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක්

   හෝ

   (ii) විශේෂ උපාධියක දෙවන පංතියේ (පහළ පෙළ) සාමාර්ථයක් හෝ සාමාන්‍ය උපාධියක, පළමුවන හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක්.

   හෝ

   (iii) උපාධි විභාගයක සාමාර්ථයක් සහ උපාධි නිබන්ධන / පර්යේෂණ නිබන්ධන මගින් පර්යේෂණ සංඝටකයක් සහිතව, පුස්තකාල සහ විඥාපන විද්‍යා (තොරතුරු විද්‍යා) ක්ෂේත්‍රයේ. අඩුම තරමින් අධ්‍යයන වර්ෂ 02 ක කාල පරාසයක පශ්චාත් උපාධි සාමාර්ථයක්.

**සැ.යු :**

(අ) ඉහත (i) හෝ (ii) යටතේ, සුදුසුකම්ලත් අපේක්ෂකයෙකු / අපේක්ෂකයින් **නොමැති නම් පමණක්**, ඉහත (iii) යටතේ, යෝග්‍යතාපූර්ණ / සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු / අයදුම්කරුවන් පිළිබඳව පත්කිරීම් සඳහා සලකා බලනු ලැබේ.

(ආ) ඉහත (i) යටතේ සුදුසුකම්ලත් අපේක්ෂකයෙකු / අපේක්ෂකයින් **නොමැති අවස්ථාවේදී පමණක්** ඉහත (ii) යටතේ සුදුසුකම් හා යෝග්‍යතාවය ලත් අයදුම්කරුවෙකු / කරුවන් සඳහා පත්වීම් ලබාදීම සඳහා සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය :**

U-AC3 (iv) රු. 54,600 - 10X1,335-67,950/- (මසකට)

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත දැන්වීම් පළකිරීමක් මගින්.

## (ආ) කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම)

**සුදුසුකම් :**

01. පහත සඳහන් විෂයයන් සඳහා **සම්මාන** සාමාර්ථ සහිතව, අ.පො.ස. (සා/පෙ) විභාගය, විෂයයන් **හයකින් (06) කින්** සමත්වීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව

(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය

(iii) ගණිතය

සහ

02. අ.පො.ස. (උ/පෙළ) විභාගය, එකම වතාවකදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පත්‍රය හැර) සමත්වීම.

**සැ.යු :**

පහත දැක්වෙන සුදුසුකම් සපුරාලන අය හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් මාස හයකට (06) කට නොඅඩු කාලසීමාවක් තුළ ලබාගත් පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්.

සහ

(ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳව වසර දෙකක පළපුරුද්ද.

- **තනතුරට සුවිශේෂී වූ සුදුසුකම් :**

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ යටතේ වන ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය / තාක්ෂණවේද විදුහල හි, ජාතික ගිණුම්කරණ තාක්ෂණශිල්පී සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

හෝ

(ආ) වාණිජ විද්‍යා විෂය ධාරාවෙන් ලබාගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්වීමේ සුදුසුකම.

**වයස :** වයස **අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි** (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) විය යුතුය.

**තෝරා ගැනීම :**

ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛණ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය :**

UMN I (III A) රුපියල් 30,725-17X300 - 35,825/- (මාසිකව)

**ප්‍රතිලාභ :**

01. තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින්, ඔහුගේ / ඇයගේ වැටුපෙන් මාසිකව කරනු ලබන අඩුකිරීම් මගින් **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට** දායකවීම ආරම්භ කරනු ලබන අතර, එයට ඔහුගේ / ඇයගේ මූලික වැටුපෙන් සියයට දහයක (10%) ක ප්‍රතිශතයකට සමාන මුදලක් වනු ඇත. විශ්වවිද්‍යාලය විසින් මෙයට අතිරේකව සිය අරමුදල්වලින්, එම විටම, ඔහුගේ / ඇයගේ ඉපයීම්වලින්, **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට**, 07% ක (සියයට හතක) ප්‍රතිශතයක් වශයෙන්, දායකත්වය ලබා දෙනු ලබන අතර, ඔහුගේ / ඇයගේ ඉපයීම්වලින් සියයට අටක (08%) ක දායකත්වයක්, **විශ්‍රාම අරමුදලට** ලබාදෙනු ඇත.

02. ඔහුගේ / ඇයගේ මූලික වැටුපෙන් සියයට තුනක (03%) ක ප්‍රතිශතයක්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්වල විධිවිධාන / ප්‍රතිපාදන ප්‍රකාරව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට විශ්වවිද්‍යාලය විසින්, දායකත්වයක් සපයනු ඇත.

03. ඉහත වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාව සහ වෙනත් දීමනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිදි, අදාළ අවස්ථාවන්හිදී කාර්ය මණ්ඩලිකයන්හට ගෙවනු ලැබේ.

**අයදුම් කළ යුතු අන්දම :**

අයදුම්පත් පෝරම සහ අදාළ විස්තර, පෞද්ගලිකව පැමිණීමෙන් හෝ 9"X4" ප්‍රමානයේ, ස්වකීය ලිපිනය ලියූ, මුද්දර අලවන ලද ලිපි කවරයක් එවීමෙන් හෝ **බොරැල්ල, කොටා පාරේ, ආයුර්වේද ශික්ෂණ රෝහලේ, 5 වන මහලේ, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**, වෙතින් ලබාගත හැකිය.

නියමිත ආකෘතිපත්‍රවල නිසි පරිදි සම්පූර්ණ කරන ද **අයදුම්පත් ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව, අයදුම්කරනු ලබන තනතුර**, සටහන් කර 2021-03-26 **වන දිනට හෝ ඉන් පෙර** ලැබෙනසේ අදාළ අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත් (අත් පිටපත්ද සමග), සහ වෘත්තියවේදී සහ සේවා සහතිකවල සහතික කළ පිටපත්ද සමග **බොරැල්ල, කොටා පාරේ, ආයුර්වේද ශික්ෂණ රෝහලේ, 5 වන මහලේ, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, වෙත ලේඛනගත කළ තැපෑලෙන් එවිය යුතුය.**

විශ්වවිද්‍යාල පද්ධතියේ / රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් සිය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

මෙම අවශ්‍යතාවහට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සහ ප්‍රමාදවී ලැබෙන (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන) අයදුම්පත්ද පූර්ව දැනුම්දීමකින් තොරව, භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂක,**
**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.**